# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
# தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
# National Child Protection Authority

දුරකථන / தொ. பே. இல. / Telephone: 011-2778911, 011-2778912, 011-2778913, 011-2778914
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2778915

නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
இல. 330, தலவத்துகொட வீதி, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர.
No. 330, Thalawathugoda Rd., Madiwela, Sri Jayawardenepura.

වි. තැපෑල / மின்னஞ்சல் / E-mail: ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.childprotection.gov.lk


EWIS PERIPHERALS (PVT) LTD.
39
02 DEC 2025
RECEIVED

මගේ අංකය - NCPA/AU/402/PROC/2025/10/(III)
දිනය - 2025.11.24

කළමනාකරු,
Ewis පෙරිපෙහෙරල්ස් පුද්ගලික සමාගම,
අංක 142,
යටාමා ගොඩනැගිල්ල
ගාලු පාර,
කොළඹ 03

**වෙළඳපොළ මිළ සැසඳුම් ක්‍රමය යටතේ පොජෙක්ටර් යන්ත්‍රයක් සහ**
**ඊට අදාළ උපාංග මිලදී ගැනීමට අදාළව මිල ගණන් කැඳවීම**
**කොන්ත්‍රාත් අංකය - NCPA/AU/402/PROC/2025/10(iii)**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා අවශ්‍ය ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් සහ ඊට අදාළ උපාංග මිලදී ගැනීමට අදාළව සුදුසු ලංසුකරුවකු තෝරාගැනීම පිණිස මිළ ගණන් කැඳවනු ලැබේ. ඊට අදාළව මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස ඔබ වෙත මෙයින් ආරාධනය කරනු ලැබේ. මීට අදාළ පිරිවිතරයන් ලංසු ලේඛන තුළ දක්වා ඇත.

මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා ශ්‍රී ලංකා රජයේ සම්මත ලංසු ලේඛන භාවිත කරනු ලබන අතර, එම ලේඛන පහත සඳහන් කොටස්වලින් සමන්විත ය.

I කොටස - ලංසුකරුවන් සඳහා උපදෙස් (Instruction to Venders)
II කොටස - දත්ත පත්‍රිකාව (Data Sheet)
III කොටස - අවශ්‍යතා ලේඛනය (Schedule of Requirements)
IV කොටස - තාක්ෂණික පිරිවිතර සහ තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල වීම (Technical Specifications & Compliance with Specifications)
V කොටස - මිළ ගණන් ඉදිරිපත් කිරීමේ පෝරමය (Quotation Submission Form)

මෙහි I කොටස මඟින් මෙම ප්‍රසම්පාදන ක්‍රියාව සිදු වන ආකාරය සහ මිළ ගණන් පිළියෙල කළ යුතු ආකාරය පිළිබඳ සියලු උපදෙස් ලබා දී ඇති අතර, II කොටස මඟින් දැක්වෙන දත්ත පත්‍රිකාව තුළ මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාළ මූලික තොරතුරු දක්වා ඇත.

එම උපදෙස් සහ තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් ලංසු ලේඛන තුළ දක්වා ඇති අදාළ ආකෘතිපත්‍ර සම්පූර්ණ කිරීම මඟින් ඔබගේ මිළ ගණන් ඉදිරිපත් කළ යුතු ය.

මෙම සම්මත ලංසු ලේඛනයන්ගෙන් බැහැරව ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාළ සම්මත ලංසු ලේඛන මේ සමග ඔබ වෙත යොමු කරමි.

සතියේ වැඩ කරන දිනවල පෙ.ව.08.30 සිට ප.ව.04.15 දක්වා 011 2 778911-14 අංක ඔස්සේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පරිපාලන අංශය ඇමතීමෙන් මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබා ගත හැකි ය.

මෙම ලංසු 2025.12.08 වන දින පෙ.ව.11.30 ට ලංසුකරුවන් ඉදිරියේ ප්‍රසිද්ධියේ විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය. ලංසු ඇගයීමෙන් අනතුරුව සාර්ථක ලංසුකරුවෙකු තෝරා ගනු ලැබේ.

ඒ.පී. සෙනෙවිරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්